විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 12(5) උප වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගෙවියයුතු ගිණුම්

ජීවන වියදම් ඇතුලත්ව විශ්‍රාම වැටුප් ගණනය කිරිමට අමාත්‍ය මණ්ඩලය තීරණය කිරීමෙන් පසුව ඒ වෙනුවෙන් විශ්‍රාම වැටුපට බැර විය යුතු මුදල් පියවීම සඳහා 2012 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබී ඇති රු.5,586,731 ක මුදල අදාල විශ්‍රාම වැටුප් ගිණුම් වලට බැර නොකර උසස් අධ්‍යාපන ආයතන වලට ගෙවිය යුතු ජීවන වියදම් දීමනා වශයෙන් සටහන් කර තිබුණි.

#### 2.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 97 වගන්තිය. | විශ්‍රාම වැටුප් අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමනාකාරීත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලි සකස් කර නොතිබුණි. |
| (ආ) 1999 අප්‍රේල් 09 දිනැති අංක අමප/99/0438/11/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නිලධාරින් වෙනුවෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන සියයට 25 ක මුදලින් සියයට 10 ක් විශ්‍රාම අරමුදලට බැර කළ යුතු වේ. එහෙත් ඊට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 747 මගින් සේව්‍යයා විසින් අර්ථසාධක අරමුදලට බැර කරනු ලබන සියයට 15 ක දායක මුදලින් 8/15 ක ප්‍රමාණයක් විශ්‍රාම අරමුදලට බැර කිරීමට කටයුතු කර තිබුණි. 2012 විගණන වාර්තාව අනුව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කලද එම ගැටළුව සඳහා නිශ්චිත විසඳුමක් ලබාගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. |

**3. <u>මූල්‍ය සමාලෝචනය</u>**

**3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.446,407,001 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු.205,857,407 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයේ රු.240,549,594 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ආයෝජන ආදායම රු.241,972,967 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

4.1 **<u>කාර්ය සාධනය</u>**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියැදි පරීක්ෂණය අනුව සේවා කාලය අවුරුදු 20 සම්පූර්ණ නොකර සේවයෙන් ඉවත් වූ සේවකයන්ට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගිණුමේ බැරට ඇති ශේෂය ගෙවීමේදී වසර 01 සිට 05 දක්වා කාල ප්‍රමාදයක් ගත වූ අවස්ථා 07 ක් නිරීක්ෂණය විය.

(ආ) සේවා කාලය අවුරුදු 20 සම්පූර්ණ නොකල සේවකයන්ට ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගිණුමේ ඇති දායක මුදල නැවත ගෙවීමේ දී අවසන්වරට පොළිය ගණනය කල දිනය සහ එම මුදල හා පොළිය ගෙවීම් කරන දිනයන් අතර කාල පමාවක් පවතින බැවින් දායකයාට අහිමිවන පොළී මුදල් ප්‍රමාණයක් පවතින බව නිරීක්ෂණය විය.

**5. <u>පද්ධති හා පාලනය</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. විශ්‍රාම වැටුප් නියාමනයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.